# ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල තුළ විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී සැලසුම්කරණ ක්‍රමවේද කොතෙක් දුරට ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

# A CRITICAL STUDY ON TO WHICH EXTENT THE PLANNING STRATEGIES HAVE BEEN USED IN THE IMPLEMENTATION OF THE CURRICULUM IN THE SENIOR SECONDARY SCHOOLS.

ආර්. ඩී. ඒ. ඩබ්ලිව්. රත්නායක
**(B.Sc., Dip. in Ed., M.Ed.)**

**M.Phil/2004/13**

541156

අධ්‍යාපන දර්ශනපති උපාධි අවශ්‍යතා පූරණය සඳහා
ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධනය

අධ්‍යාපන පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

UCLIB
541156

2006 දෙසැම්බර්

## සාරාංශය


මෙම පර්යේෂණ අධ්‍යයනයෙහි මූලික අරමුණ වන්නේ, කුරුණෑගල අධ්‍යාපන කලාපයේ ජ්‍යෙෂ්ඨ ද්විතියික පාසල් තුළ විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී සැලසුම්කරණ ක්‍රමවේද කොතෙක් දුරට ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳ ව අනාවරණය කර ගැනීමයි. එහි දී පාසල තුළ යොදා ගෙන ඇති සැලසුම්කරණ ක්‍රමවේද මොනවා ද? ඒවා කුමක මට්ටමකින් ක්‍රියාත්මක වේ ද? 1AB සහ 1C පාසල් වර්ග අනුව ක්‍රියාත්මක මට්ටමෙහි වෙනසක් තිබේ ද? ඒවා ක්‍රියාත්මක කිරීමේ දී විදුහල්පති සහ එහි පාර්ශවකරුවන් මුහුණ දෙන ගැටලු සහ අභියෝග මොනවා ද? යන්න විමසා බලනු ලැබේ.

පළමුවන පරිච්ඡේදයේ දී, මෙම ගැටලුව හැඳින්වීම සිදු කර ඇත. එහි දී සැලසුම්කරණයේ ස්වභාවය සහ විෂයමාලාවක ස්වභාවය පිළිබඳ ව මූලික වශයෙන් විමර්ශනය කර ඇත. ඉන් පසු විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ සැලසුම්කරණ ක්‍රමවේද පාසල තුළ යොදා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දී ඇත. අනතුරු ව සංකල්ප සිතියමක් ආධාරයෙන් මෙම අධ්‍යයනයේ සීමා පෙන්වා දී ඇත. එහි දී, මෙම අධ්‍යයනය තුළ දී ප්‍රධාන වශයෙන් පාසල තුළ අධ්‍යයනයට ලක් කරනු ලබන විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ සැලසුම්කරණ ක්‍රමවේද විසිපහක් දක්වා ඇත.

දෙවන පරිච්ඡේදයේ දී, මෙම පර්යේෂණ අධ්‍යයනයට අදාළ සාහිත්‍ය විමර්ශනය සිදු කර ඇත. එහි දී ප්‍රථමයෙන් ම අධ්‍යාපන සැලසුම්කරණයේ ඉතිහාසය විදේශීය සහ දේශීය වශයෙන් විමර්ශනය කර ඇත. දෙවනුව පර්යේෂණ සාහිත්‍ය විදේශීය සහ දේශීය වශයෙන් පර්යේෂණ අරමුණුවලට අදාළ ව විමර්ශනය කර ඇත.

තුන්වන පරිච්ඡේදයේ දී, මෙම අධ්‍යයනයට අදාළ පර්යේෂත ක්‍රමවේදය දක්වා ඇත. මෙම අධ්‍යයනය සඳහා කුරුණෑගල අධ්‍යාපන කලාපයේ 1AB වර්ගයේ පාසල් පහක් සහ 1C වර්ගයේ පාසල් දහයක් වශයෙන්, පාසල් පහළොවක් යොදා ගන්නා ලදි. එහි දී, විදුහල්පතිවරුන් පහළොවක්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් තිහක්, අංශ ප්‍රධානින් තිහක්, ගුරුවරුන් හැත්තෑපහක් සහ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයින් හැත්තෑපහක් අධ්‍යයන නියැදියට ඇතුළත් කර ගන්නා ලදි. දත්ත එකතු කර ගැනීම සඳහා නිරීක්ෂණ ආකෘතියක් සහ ප්‍රශ්නාවලී පහක් යොදා ගන්නා ලදි. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය යොදා ගන්නා ලදි.

හතරවන පරිච්ඡේදයේ දී, මෙම අධ්‍යයනයේ දී රැස් කර ගත් දත්ත ඉදිරිපත් කිරීම, විශ්ලේෂණය සහ අර්ථකථනය සිදු කර ඇත. එහි දී වගු සහ ප්‍රස්තාර යොදා ගෙන ඇති අතර, ප්‍රතිශත සහ සරල සංඛ්‍යාන විද්‍යා ක්‍රම මගින් දත්ත විශ්ලේෂණය සහ අර්ථකථනය සිදු කර ඇත. පර්යේෂණ අරමුණුවලට අනුව, ප්‍රධාන උප මාතෘකා පහක් යටතේ මෙය සිදු කර ඇත.

පස්වන පරිච්ඡේදයේ දී, මෙම අධ්‍යයනයේ නිගමන හා යෝජනා ඉදිරිපත් කර ඇත. එහි දී ප්‍රථමයෙන් නිගමන ද දෙවනුව යෝජනා ද තෙවනුව අනාගත පර්යේෂණ සඳහා යෝජනා ද, ඉදිරිපත් කර ඇත. කුරුණෑගල අධ්‍යාපන කලාපයේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් තුළ විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ සැලසුම්කරණ ක්‍රමවේද ක්‍රියාත්මක මට්ටම සියයට හැත්තෑහතකි. 1AB වර්ගයේ පසාල් තුළ මෙය හැත්තෑහයක් වන අතර, 1C වර්ගයේ පාසල් තුළ මෙය අසූඑකකි. ඒ අනුව, මෙම සැලසුම්කරණ ක්‍රමවේද පාසල් තුළ ඉහළ මට්ටමකින් ක්‍රියාත්මක වුවත්, පාසල් වර්ග අනුව ඒවා ක්‍රියාත්මක මට්ටමෙහි වෙනසක් ඇත. මෙම සැලසුම්කරණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමේ දී විදුහල්පති සහ එහි පාර්ශවකරුවන් විවිධ ගැටලු සහ අභියෝගවලට මුහුණ දෙන අතර, ඒවා ප්‍රධාන වශයෙන් හයකි.

Library

# ABSTRACT

The primary aim of this research study is to find to which extent the planning strategies have been used in the implementation of the curriculum, in the senior secondary schools in Kurunegala educational zone. An attempt has been made to look into the problems such as what planning strategies are used in the school, at what level are they being implemented, whether there is a difference in the inplementational level according to the type of 1AB and 1C schools, and which problems and challenges are faced by the principal and other partners.

The research problem is introduced in the first chapter. It is followed by a primary discussion of the nature of the planning and the nature of the curriculum. The necessity of employing planning strategies in implementing the curriculum has been pointed out next. It is followed by a concept map which is used to illustrate the limitations that affect the research study. Mainly by this, twenty five planning strategies in implementing the curriculum are presented which are to be studied in the schools.

The second chapter looks into the literature relevant to this research study. Firstly, the history of the educational planning has been surveyed as foreign and local. Secondly, the research literature pertaining to the research objectives has been reviewed as foreign and local.

In the third chapter, research methodology relevant to this research study is presented. Fifteen schools from Kurunegala educational zone have been selected for this research study. Five of them are 1AB type schools and

ten schools are 1C type. Fifteen principals, thirty deputy principals, thirty sectional heads, seventy five teachers and seventy five senior students were included for studying sample. An observation schedule and five questionnaires were used for collecting data. Quantitative data analysis has been mainly used for analyzing data.

In the fourth chapter, presentation, analysis and the interpretation of the data collected in this research study has been done. Tables, graphs have been used for this purpose and simple statistical methods have been used for analyzing and interpreting data. This has been treated under five sub topics in keeping with the objectives of the research study.

The conclusions and the recommendations of this research study are presented in the fifth chapter. Firstly, the conclusions, secondly the recommendations and thirdly the recommendations relevant to the future researchers have been done. The operational level of using planning strategies in the implementation of the curriculum in the senior secondary schools in Kurunegala educational zone is seventy seven percent. In the 1AB type schools this figure is seventy six percent. While in the 1C type schools, it is eighty one percent. Although the use of planning strategies remains at a high level in schools, there seems to be a difference in their operational levels according to the type of schools. Six main types of problems and challenges faced by the principal and other partners in implementing the planning strategies have been identified.